# චතුෂ්කෝටිය හා ආයුර්වේදය

එස්. පි. මොල්ලිගොඩ *

භාරතීය තර්කය පිළිබඳ ව විමර්ශනය කළ බොහෝ විද්වතුන් එහි හරය ගැබ් වී ඇත්තේ බෞද්ධ තර්කය තුළ බව ප්‍රකාශ කර ඇත. බෞද්ධ දර්ශනය තුළ තර්කානුකූල චින්තනශීලි හා යථාර්ථවා දි සත්‍යතාවක් අන්තර්ගත වීම එයට හේතුවයි. විචාරශීලි ආගමක් වූ බුද්ධාගම විචාරයට මෙන් ම නිදහස් චින්තනයට හා විමර්ශනයට විවෘත වූවෙකි. ඉන්දිය ආගම් ශාස්තෲවරයා විවේචනය කිරීම පාපයක් සේ සැලකූ කල්හි ඒ සඳහා විවෘත වූ එක ම ආගම බුදුදහම බව පිළිගත් මතය යි. බුදුරජාණන් වහන්සේ කාලාම සූත්‍රයෙන් ලබා දුන් ශ්‍රේෂ්ඨ පණිවිඩය නම් සියල්ල තම නුවණින් විමසා බලා එය නිවැරදි ව විචාරශීලි ව දැකීම බුද්ධිමතා ගේ ලක්ෂණය බවයි. මෙවැනි නිදහස් චින්තනශීලි පසුබිමක් මත බුදුහිමියන් වෙත පැමිණි තර්ක විතර්ක ඉදිරිපත් කළ පිරිස අතිමහත් ය. බ්‍රහ්ම ජාල සූත්‍රයේ දැක්වෙන පරිදි මිථ්‍යා දෘෂ්ටික මතවාද සැට දෙකකි. මෙවැනි ආගමික නායකයන් හා බුදුරජාණන් වහන්සේ අතර ඇති වූ ප්‍රශ්න හා පිළිතුරු මගින් චතුෂ්කෝටික තර්ක ක්‍රමය බිහි වූ බවට සාක්ෂි තිබේ. ප්‍රකාශයක් සත්‍ය හෝ අසත්‍ය වශයෙන් හඳුනා ගන්නා කල්හි එම ලක්ෂණයන් තර්ක ශාස්ත්‍රයේ හඳුන්වනු ලබන්නේ "සත්‍යතා ඇගයුම්" ලෙසිනි. සියලු ප්‍රකාශයන් එක්කෝ සත්‍යය නැත්නම් අසත්‍ය යන මූලික පිළිගැනීම් මත පදනම් වන තර්ක ක්‍රමය ද්විකෝටික තර්ක ක්‍රමයයි. මෙ ම තර්ක ක්‍රමය බටහිර තර්ක ශාස්ත්‍රයේ පිළිගන්නා සත්‍යතා හා ඇගයුම් ක්‍රමයයි.
මෙවැනි තර්ක පද්ධතියක පැවැතිය හැක්කේ සත්‍යාසත්‍ය භාව්‍යතා දෙකකි.

උදා: ඔහු සතුටින් සිටී.
ඔහු සතුටින් නොසිටී.

මෙවැනි පද්ධතියක් තුළ තර්ක ශාස්ත්‍රීය නියමයන්ට අනුව (එනම් මධ්‍ය බහිෂ්කෘත නියමයට අනුව) එක්කෝ පළමු ප්‍රකාශය සත්‍ය විය යුතුයි. නැතිනම් දෙවැනි ප්‍රකාශය සත්‍ය විය යුතුයි. මෙහි දී එකවර සත්‍ය විය හැක්කේ එක් ප්‍රකාශයක් පමණි. එනමුත් එවැනි සිදුවීම් හා සම්බන්ධ ව මීට වඩා ගැඹුරින් ප්‍රකාශන ඉදිරිපත් කිරීමට හැකියාවක් තිබිය හැකි ය. මෙය ඉතාමත් සංකීර්ණ සේ විද්‍යමාන වුව ද, බුදුදහම මෙවැනි සංකීර්ණ ඇගයුම් ක්‍රමයක් පිළිගෙන තිබේ. මෙය බුදුදහමෙන් හඳුන්වාදෙන, බුදුදහමට පමණක් අයත් තර්ක ක්‍රමයක් නොවන අතර, ලොව පැවතිය හැකි භාවයන්ගේ යථා ස්වරූපය පැහැදිලි කිරීම සඳහා යොදා ගත් උපක්‍රමයක් සේ හඳුන්වාදීම සුදුසු සේ හැඟේ. මෙවැනි අවස්ථාවන් සඳහා භාවිත කළ හැකි සත්‍යතා ඇගයුම් 4ක් බෞද්ධ තර්ක ශාස්ත්‍රයේ පෙන්වා දෙයි. මෙ ම ඇගයුම් පද්ධතිය "චතුෂ්කෝටිය" නමින් හඳුන්වනු ලැබේ. මෙ ම සත්‍යතා ඇගයුම් ක්‍රමය අපට නොපෙනෙන, වර්තමානයේ අත්විඳිය නොහැකි ලෞකික හෝ ලෝකෝත්තර සිද්ධි පිළිබඳ ව යෙදීමේ දී තේරුම් ගැනීමට අපහසු කාර්යයක් සේ දිස් වුව ද, සමීප අත්විඳි සිද්ධි සම්බන්ධයෙන් සැලකීමේ දී එහි සත්‍යතාව වටහා ගැනීම අසීරු නො වේ. උභයාන්ත තර්ක ක්‍රමය ඉක්මවා යන තර්ක ක්‍රම පිළිබඳ කෙටි ඉතිහාසයක් යුරෝපීය තර්කයේ දන්දැකීම් අල්ප වුව ද, ඉන්දියානු බහු අන්ත තර්ක ක්‍රම පිළිබඳ ඉතිහාසය ඉතා ඈතට දිව යයි. මෙහි දි සංශයවාදීන් ගේ පඤ්ච ප්‍රකාර ප්‍රකාශනයන් මෙන් ම ජෛන දාර්ශනිකයන්ගේ සප්ත භංගි ක්‍රමය ද ඉතාමත් වැදගත් වේ.

### සංශයවාදීන්ගේ පඤ්ච ප්‍රකාශන

1. එවමපි මෙ නො – මම එසේ නො කියමි
2. තථාපි මෙ නො – මම මෙසේ නො කියමි
3. අඤ්ඤථාපි මෙ නො – මම අන් අයුරකින් නො කියමි
4. නො ති පි මෙ නො – මම නැතැයි නො කියමි
5. නො නෝ තිපි මෙනො – මම නැත නැත යැයි නො කියමි.

ජෛන දර්ශනයේ එන සප්ත භංගි ක්‍රමය පහත පරිදි වේ.[1]
ස්‍යාද් අස්ති – (යමක්) පවතී.
ස්‍යාද් නාස්ති – (යමක්) නොපවතී.
ස්‍යාද් අස්ති නාස්තිච – (යමක්) පැවතිය ද හැකි යි.
ස්‍යාද් අවක්තව්‍යං – (යමක්) වචනයෙන් විස්තර කිරීමට නො හැකි යි.
ස්‍යාද් අස්ති අවක්තව්‍යං – (යමක්) පැවැතිය හැකි යි.
ස්‍යාද් නාස්ති අවක්තව්‍යං – (යමක්) නො පැවැතිය හැකියි. ඒත් කිව නො හැකි ය.
ස්‍යාද් අස්ති නාස්ති අවක්තව්‍යං (යමක්) පැවැතිය ද නො පැවතිය ද හැකි ය. ඒත් කිව නො හැකි යි.

ද්වි කෝටික තර්ක ක්‍රමය හා සම්බන්ධ මූලික සිද්ධාන්ත තුනකි.
අවිසංවාදි නියමය: (Principle of Non Contradiction)
A, B වන අතර B ට නොවී සිටීමට නො හැකි ය. එනම් විසංවාද ලක්ෂණ 2ත් එකවර තිබීමට නො හැකි ය.
මධ්‍ය බහිෂ්කෘත නියමය: (Principle of Excluded Middle)
A හා A නොවේ, යන්නෙන් එකක් අනිවාර්යයෙන් ම සත්‍ය විය යුතු අතර ඒ දෙක අතර අතරමැදි තත්ත්වයන් තිබිය නො හැකි යි.
අසත්‍යතා නියමය: (Principle of Non Identify)
A, A ම වේ. උදා: සරත් සරත් ම වේ.

### චතුෂ්කෝටියේ තාර්කික ස්වරූපය

ඇරිස්ටෝටලියානු තර්ක ශාස්ත්‍රය නූතන තර්ක ශාස්ත්‍රය ආදි තර්ක ශාස්ත්‍රවල අන්තර්ගත රූපික තර්ක ක්‍රමය මගින් මෙ ම චතුෂ්කෝටි සිද්ධාන්තය විස්තර කිරීම පිළිබඳ ව විද්වතුන් ගේ අවධානය යොමු වී තිබේ.

---

* බී. ඒ. එම්. එස්. (ගෞරව) කොළඹ විශ්ව විද්‍යාලය,
එම්. ෆිල්. පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
කථිකාචාර්ය, කොළඹ විශ්ව විද්‍යාලය, දේශීය වෛද්‍යවිද්‍යායතනය.
ආයුර්වේද සමීක්ෂාව II/III 2007, පිටු 80 – 83

කේ. එන්. ජයතිලක, ටී. ආර් එන් මූර්ති, ලුවිස්ද ලා වැලේ, පොසැන් ජැන් ලූනාසිවිත්ස්, ඇලෙක්ස් වේමන්, රිචඩ්. එච්. රොබින්සන්, රිචඩ් එස්. වයි චී ඩී. ජේ. කලුපහන, ආර්. ඩී. දයාරත්න සහ කේ. බී. මනිලාල් යන ආචාර්ය මහාචාර්යවරු සුවිශේෂී වෙති.

මේ පිළිබඳ ව ඇලෙක්ස් වේමන් ලියූ විශේෂිත ලිපියක් Philosophy East and West: (1977) සඟරාවේ පළවී තිබේ.[2] පොසැන් නම් ප්‍රංශ ජාතික දාර්ශනිකයා ගේ මතය අනුව චතුෂ්කෝටිය චින්තනය නියම හා තර්කය මග හරී. (catuskoti statements ignore the laws of thought and hence are not understandable)[3]

රිස් ඩේවිඩ් හා බෲ පෙන්වා දෙන්නේ චතුෂ්කෝටිය චින්තන නියම වලට එකඟ බවයි. (Catuskoti statements, some how relate to the four laws of thoughts)[4] රිචඩ් එස්. රොබින්සන් පෙන්වා දෙන පරිදි චතුෂ්කෝටිය එකිනෙකාට අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාරී නොවන වියෝජක සමූහයකි. මේවා එක්ව ගැනීමේ දී එකක් පිළිගන්නා විට අනෙක් ඒවා පිළි නොගනී. මෙ ම වියෝජක අන්‍යෝන්‍ය බහිෂ්කාරී හා සාමූහික නිරවශේෂයක් බව පෙන්වයි. නමුත් මෙ ම මතය හා එකඟ නොවන මහාචාර්ය කේ. එන්. ජයතිලකයන් පවසන්නේ මෙ ම තර්කයන් මනඃකල්පිත ව ඇති කරගත් ඒවා බවයි.[5]

චතුෂ්කෝටික ප්‍රකාශන පිළිබඳ ව මහාචාර්ය කළුපහන මහතා පෙන්වා දෙන්නේ ඒවා හුදෙක් ම සතරාකාර වූ නිශේධන ප්‍රකාශන බවයි. (four fold negation) එනම් සාමාන්‍ය අවස්ථාවල දී මෙන් එක් අවස්ථාවක් සත්‍යවන අතර අනිකුත් අවස්ථා 3 අසත්‍යවීම මෙහි දී සිදු නොවන බවත් ය. මෙම අවස්ථා හතර ම සත්‍යක්ෂණය කළ නොහැකි ප්‍රකාශ ලෙස බැහැර කිරීම හැකි බවත් ඔහු තව දුරටත් පෙන්වා දෙයි.

චතුෂ්කෝටික ප්‍රකාශ වශයෙන් මහාචාර්ය ජයතිලකයන් බෞද්ධ දර්ශනයෙන් උපුටා දක්වන ප්‍රකාශ පහත පරිදි වේ.

1. අන්තවා අයං ලොකො (මේ ලෝකය අන්තවත්ය-හාත්පසින් ම සීමා වේ.)
2. අනන්තෝ අයං ලොකො (මේ ලෝකය අනන්තවත්ය-හාත්පසින් ම සීමා නො වේ.)
3. අන්තවාච අයං ලොකො අනන්තොච (ලෝකය අන්ත මෙන් ම අනන්ත ද වේ)
4. නේ වායං ලොකො අන්තවා න පනානන්තෝ (මේ ලෝකය අන්ත ද නො වේ. අනන්ත ද නො වේ.)

. මෙහි පළමු වැන්නේත් ලෝකය සෑම ආකාරයෙන් ම සීමිත ලක්ෂණවලින් යුක්ත බව පෙන්වයි. දෙවැන්නෙන් පැවසෙන්නේ ලෝකය ඊට ප්‍රතිවිරුද්ධ ලක්ෂණවලින් යුක්ත බවයි. 3 වැනි අවස්ථාවෙන් ලෝකය සෑම අතින් ම අන්ත බවත් එමෙන් ම ලෝකය සෑම, අතින් ම අනන්ත බවත් පෙන්වා දෙයි. මහාචාර්ය ජයතිලකයන් පවසන්නේ මෙයින් අදහස් කරන්නේ, ලෝකය ඇතැම් ආකාරයෙන් අන්ත බවත් ලෝකයේ ඇතැම් ආකාරවලින් අනන්ත බවත් ය.[6] 4 වැනි අවස්ථාවේ දි ලෝකය අන්තවත් ද නො වේ. අනන්තවත්ද නො වේ යනුවෙන් පැව සේ.

දීඝ නිකායේ විස්තර වන පහත ප්‍රකාශන ද චතුෂ්කෝටි තර්ක ස්වාභාවය උපුලන බව පෙනේ.

(i) ඒකාන්ත සුඛ අත්තා හෝති (එනම් ආත්ම අත්‍යන්තයෙන් ම සොම්නස ය)
(ii) ඒකාන්ත දුක්ඛි අත්තා හෝති (එනම් ආත්මය අත්‍යන්තයෙන් ම දොම්නස් ය)
(iii) සුඛ දුක්ඛි අත්තා හෝති (ආත්ම සොම්නස් මෙන් ම දොම්නස් ද වේ)
(iv) අදුක්ඛමසුඛි අත්තා හෝති (එනම් ආත්මයට සොම්නස් හෝ දොම්නස් සංවේදන නැත)[7]

නිතර ම ත්‍රිපිටක සාහිත්‍යයේ සඳහන් වන තව උදාහරණයක් පහත දැක් වේ.

1. පුග්ගලෝ අත්තන්තපො (එනම් තමා ම වධ වේදනාවලට පැමිණෙන පුද්ගලයා).
(උදා: තාපසයා)
2. පුග්ගලෝ පරන්තපො (අන්‍යයන් වධ වේදනාවලට පත් කරන පුද්ගලයා. (උදා: දඩයම්කරු)
3. පුග්ගලෝ අත්තන්තපො පරන්තපොච (තමා මෙන් ම අනුන් ද වේදනාවට පත්කරන්නන්. (උදා: යාග කරන රජු)
4. පුග්ගලෝ නෙ වත්තන්ත පො න පරන්තපො (තමා හෝ අනුන් හෝ වේදනාවට පත් නොකරන්නා)[8]

කේ. එන්. ජයතිලකයන් පෙන්වා දෙන පරිදි මෙ ම චතුෂ්කෝටික තර්ක ක්‍රමය පිළිගැනීම සඳහා පෙළඹීමට හේතුව වන්නේ මේ සතරාකාර භව්‍යතාව මගින් ආනුභූතික දත්ත පිළිබඳ ව ප්‍රකාශනයන්හි ඉස්මතු විය හැකි සංදිග්ධතාවන් වළකමින් සූක්ෂ්ම වූත්, වඩා යෝග්‍ය වූත් වර්ගීකරණයන් සිදු වීම යි. එමෙන් ම එකහෙළා ද්විධාකරණයෙන් බෙදීමට (ද්විභාජනය Dichotomous division) වඩා මේ ක්‍රමය අවු ලුහුඩුකම්වලින් තොර වීමයි. මෙ වැනි චතුෂ්කෝටි ප්‍රකාශන ත්‍රිපිටක සාහිත්‍යයේ බහුල ව දක්නට ලැබේ. ත්‍රිපිටකය ඉතාමත් විටිමත් ව තාර්කික ව ගොඩනැංචා ඇති බවත්, එය නූතනයේ දක්නට ලැබෙන ඉතා උසස් ම තර්ක ශාස්ත්‍ර ග්‍රන්ථ හා සමාන බවත් වැටලියන් දක්වා ඇත්තේ එබැවිනි. ඉහත ප්‍රකාශන 4 වැනි ප්‍රකාශනයෙන් කෙරෙන්නේ පළමු හා දෙවැනි ප්‍රස්තුත ප්‍රතික්ෂේප කිරීම යි.

බොහෝ ජනප්‍රිය ප්‍රබල මතයන් ලෙස මහාචාර්ය අසංග තිලකරත්නයන් පෙන්වා දෙන්නේ සත්‍ය අසත්‍ය, සම්ප්‍රයුක්ත උභය ප්‍රස්තුතය ම හෝ ඒ දෙකේ ම හෝ සංයෝජනය හෝ ප්‍රතික්ෂේප වන්නේ නම් එම නියමිත සත්‍යය හෝ කරුණු ප්‍රස්තුතයන් මගින් ප්‍රකාශ කළ නො හැකි බව යි.[9]

තර්ක ශාස්ත්‍රානුකූලව ඉහත අවස්ථාවන් විග්‍රහ කිරීමේදී I, II පමණක් පැවතිය හැකි තත්ත්වයන් සේ පෙනුන ද, යථාලෝක ස්වභාවය පිළිබඳ ව කල්පනා කිරීමේ දී III, IV යන අවස්ථා සේ දැකීමට හැකි බව පෙනේ.

ඇල්පිටියේ ඥානිස්සර හිමියන් මෙ ම තාර්කික ස්වරූපය එදිනෙදා ජීවිතයේ දැක්විය හැකි ආකාරය පහත පරිදි විස්තර කර ඇත.

පැන ඇත (පැන් ඇත්තේ පැනක ස්වරූපයෙනි)
පැන නැත (පැන වෙනත් ස්වරූපයෙකින් නැත)
පැන ඇත එමෙන් ම නැත (පැනෙහි පැවැත්මක් ඇති අතර පැනෙහි පැවැත්මක් නැත)
පැන ඇත්තේ ද නැත. නැත්තේ ද නැත.

මේ පිළිබඳ තව දුරටත් කරුණු දක්වන ඥානිස්සර හිමි පවසන්නේ මෙ ම කරුණු ජෛන ස්‍යාද් වාදය හා අතීත භාරතීය සංශයවාදීන්ගේ පංචවිධ ප්‍රතිශෝධන හා යම් තරමක සම්බන්ධතාවක් පවත්නා බව යි.

දීඝ නිකායෙන් උපුටා ගන්නා ලද නවින් ප්‍රකාශයක් පහත දැක් වේ

අත්ථි සත්තා ඕපපාතිකා (ඕපපාතික සත්තු ඇත)
නත්ථි සත්තා ඕපපාතිකා (ඕපපාතික සත්තු නැත)
අත්ථි ච නත්ථි ච සත්තා ඕපපාතිකා (ඕපපාතික සත්තු ඇත. එමෙන්ම නැත)

නෙව අත්ථිච න නත්ථි ච සත්තා ඕපපාතිකා (ඕපපාතික සත්තු ඇත්තේ ද නැත. නැත්තේ ද නැත)

මේ පිළිබඳ තවදුරටත් විස්තර කරන ඒ හිමියන් පවසන්නේ මේ පිළිබඳ ව කාලාන්තරයක් විද්වතුන් ගේ සාකච්ඡාවට භාජන වූ බව යි. ස්‍යාද් වාදයේ මෙන් එක් එක් දෘෂ්ටි කෝණයකින් මේ ප්‍රකාශ හතර සත්‍ය ලෙස ගනු නො ලැබේ. බොහෝ විට මෙ වැනි ප්‍රකාශවල එන වාක්‍ය හතරෙන් තුනකට හෝ ප්‍රතික්ෂේප කරනු ලැබි ය. චතුෂ්කෝටිය පිළිබඳ ප්‍රධාන ගැටළුව වූයේ ඉහත කී තුන්වෙනි හා හතරවැනි ප්‍රකාශ විසංවාදී ඒවා ලෙස පෙනීම යි. එහෙයින් ඒවා තේරුම් ගැනීම පිළිබඳ ගැටලු මතු වේ. ඒවා අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාරී වේ ද, යන්න පිළිබඳ ව ද අවධානය යොමු වී තිබේ. මේ පිළිබඳ ඇල්පිටියේ ඥානිස්සර හිමියන් ගේ මතය වන්නේ සත්‍ය - අසත්‍ය යන දෙ ඇඟයුම් ගන්නා මෙ ම චතුෂ්කෝටි ප්‍රකාශවල ආපෝහක ලක්ෂණ ඇති බව යි. අපෝහනයේ දී බොහෝ විට යම් කිසි මතයක නිරවද්‍යතාව ඔප්පු කිරීම සඳහා ඊට ප්‍රතිවිරුද්ධ මතයේ සාවද්‍යතා ව පෙන්වීම උපයෝගි කරගනු ලැබේ. චලිතය මායාවක් බව දැක්වීමට සේනෝ උපයෝගි කර ගත්තේ ආපෝහන ක්‍රමයයි. ඒ පිළිබඳ ඔහු චලිතය ඇත යන මතය පරස්පර විරෝධී නිගමනවලට තුඩු දෙන බව පෙන්වා යි. මෙම මතය ස්ථාපිත කිරීම සඳහා ඔහු පහත කරුණු ගෙනහැර දැක්වී ය. වේගයෙන් විදින ලද හීයක් චලනය නොවේ.. (ගමන් නොකරයි.) මක්නිසා ද යත්, විදින ලද හීය එක මොහොතක, අවකාශයේ ඒ හීයේ දිගට අවශ්‍ය ඉඩ ප්‍රමාණය සපුරා සිටී. එහෙයින් හීය ඒ මොහොතේ ඇත්තේ නිශ්චලව යි. ඊළඟ මොහොතේ ද හීය එයට අවශ්‍ය ඉඩ ප්‍රමාණය සපුරා ගෙන අවකාශයේ රැඳී සිටී. ඒ මොහොත ද නිශ්චල ය. මෙසේ සෑම මොහොතක ම හීය තමාට අවශ්‍ය ඉඩ ප්‍රමාණය අවකාශයේත් ලබාගෙන නිශ්චලව සිටී. එනම් කොයි මොහොතකවත් හීය චලනය වෙමින් නොපවතින බවත්, සෑම විට ම නිශ්චල ව පවතින බවත් පෙන්වමින් සේනෝ තම මතය ස්ථාපිත කළේ ය. මෙ ම විග්‍රහයට අනුව චතුෂකෝටියේ ද ආපෝහන ලක්ෂණ පවතී. වස්තුවක් ගැන කළ හැකි ප්‍රකාශ මෙම කෝටි සතරෙන් නිරවශේෂ වන බව සලකා ඒ එක් එක් කෝටියට "නැත" යන පිළිතුරු දීමෙන් යම් වස්තුවක් ගැන කළ හැකි එවැනි ප්‍රකාශ සියල්ලක් නිෂ්ප්‍රභා කිරීමට හැකි හෙයිනි. මහායාන බුදුදහමේ කර්තෘ පේ සැලකෙන නාගාර්ජුන පාදයෝ චතුෂ්කෝටියේ ශූන්‍යතා ලොව එකම සනාතන ධර්මය ලෙස සැලකී ය. තථාගතයන් වහන්සේට පරිනිර්වාණයෙන් පසු සත්භාවයන් ඇත් ද? මෙය අව්‍යාකෘතයක් ලෙස බෞද්ධයෝ ගනිති. එය චතුෂ්කෝටික ස්වරූපයෙන් දීඝ නිකායේ එයි.

තථාගතයන් වහන්සේට පරිනිර්වාණයෙන් මතු සත් භාවයන් ඇත
තථාගතයන් වහන්සේට පරිනිර්වාණයෙන් මතු සත් භාවයන් නැත
තථාගතයන් වහන්සේට පරිනිර්වාණයෙන් මතු සත් භාවයන් ඇත. එමෙන් ම නැත
තථාගතයන් වහන්සේට පරිනිර්වාණයෙක් මතු සත් භාවයන් ඇත්තේ ද නැත. නැත්තේ ද නැත.

මේ පිළිබඳ විග්‍රහයක යෙදෙන නාගාර්ජුන පාදයන් පවසන්නේ, මේවා අපිට තේදිනකවත් පිළිතුරු ලබාදිය හැකි ප්‍රශ්න නොවන බවයි. නිවනත් සසරත් අතර වෙනසක් නැති බවත්, සියල්ල සාපේක්ෂ බවත් එතුමා තවදුරටත් ප්‍රකාශ කරයි. චතුෂ්කෝටික ස්වරූපයෙන් විශ්ලේෂණයට භාජන කළ හැකි යම් ප්‍රකාශන ආයුර්වේදයෙන් ලබාගත හැකි අවස්ථා ඉතා විරල බව ආයුර්වේද මූලග්‍රන්ථ පරිශීලනයෙන් පෙනේ. යම්කිසි රෝගයක සුව වීම සම්බන්ධයෙන් ආයුර්වේදයේ දැක්වෙන ප්‍රකාශනයන් පහත දැක්වේ.

සාධ්‍යාසාධ්‍ය විභාගඥෙ - ඥානපූර්වං චිකිත්සක
කාලේ චා රභතේ කර්ම - යත් තත් සාධයති ධ්‍රැවම්

සුඛසාධ්‍යං මතං සාධ්‍යං - කෘච්ඡසාධ්‍යමථා පිච
ද්විවිධං චා ප්‍යසාධ්‍යං ස්‍යාද් - යාප්‍යං යච්චා නුපක්‍රමම් [11]

ඉහත ශ්ලෝක පාඨ අනුව රෝග සුවවීම හා සුව කිරීමේ ආකාර අනුව ප්‍රධාන කොටස් 3කි.

* සාධ්‍ය
* අසාධ්‍ය
* යාප්‍ය

සාධ්‍ය යනු Sadhya - to be subdued, mastered, won, conquerable, healed, Cured යන අරුත්වල යෙදේ. [12]

මෙහි සරළ අරුත නම් සුව කළ හැකි රෝග සාධ්‍ය ලෙස වර්ග කර තිබීමයි. අසාධ්‍ය නම් සුව කළ නොහැකි රෝග යි. මීට අමතර ව යාප්‍ය යනුවෙන් රෝග කාණ්ඩයක් දක්වා තිබේ. යාප්‍ය යනු යා ධාතුවෙන් නිෂ්පන්න වූ යාපයති, යන ක්‍රියාපදයෙන් සෑදුණ වචනයකි. මෙහි සාමාන්‍ය අරුත වන්නේ පවත්වාගෙන යාම එක්ව ගමන් කිරීම යනුයි. වෛද්‍ය විද්‍යාවට අනුව යාප්‍ය යනුවෙන් හඳුන්වනු ලබන්නේ සුව කළ නොහැකි හා සුව කළ හැකි යන ලක්ෂණ දෙකෙන් ම සමන්විත වූ රෝග කාණ්ඩයකි. එනම් රෝග සුව වී ඇති බව බාහිර වශයෙන් රෝගියා අවබෝධ කර ගනී. බාහිර හා අභ්‍යන්තර රෝග ලක්ෂණවලින් රෝගියා විනිර්මුක්ත වී ඇති හෙයින් රෝගය සුව වී ඇතැයි වෛද්‍යවරයා ද තාවකාලික නිගමනයට එළඹේ. නමුත් සත්‍ය වශයෙන් ම මෙ ම රෝගය වෛද්‍ය මූලධර්මවලට අනුකූලව සුව වී නැත. යාප්‍ය රෝගවලට උදාහරණ නම් කුෂ්ඨ, ශ්වාස ආදී යයි. මෙ ම රෝග සුව වීම, සුව නොවීම හා යාප්‍ය යන අවස්ථාවන් චතුෂ්කෝටික ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමට හැකි බව පෙනේ.

උදා :-
රෝගය සුව වී ඇත.
රෝගය සුව වී නැත.
රෝගය සුව වී ඇත. එමෙන් ම සුව වී නැත.
රෝගය සුව වී ද නැත. සුව නොවී ද නැත.

ආයුර්වේදයේ විස්තර කෙරෙන යම් යම් රෝග තත්ත්ව, එනම් ශ්වාස (ඇදුම) Bronchial asthma, වාතරක්ත, යම් යම් කුෂ්ඨ රෝග (Skin disease) Psorisis (කිටිභ) සහ උන්මාද මෙයට උදාහරණ වේ. මෙ ම රෝග යම් ප්‍රතිකාර හමු වේ සම්පූර්ණයෙන් ම සුවය ලබා ඇති සේ දිස් වුව ද යම් විටෙක නැවත රෝගය මතු කරනු දැකිය හැකි ය. රෝගය සුව වීම හා නැවත මතු කිරීම අතර කාල පරායය විවිධ විය හැකි ය. මෙම රෝග සම්බන්ධයෙන් පළමු ප්‍රකාශය විටෙක ඉදිරිපත් කළ හැකි ය. 'එනම් රෝගය සුව වී ඇත' යනුවෙනි.

නමුත් මෙ ම රෝග නිච්චාවට ම සුව වී ඇති බව සඳහන් කළ නොහැකියි. 'එනම් රෝගය සුව වී නැත' යන ප්‍රකාශය ද විවේක සත්‍ය වන බව පෙනෙයි. මෙහි දී රෝගය සුව වී ඇත. එමෙන් ම නැත යන ප්‍රකාශය ද ඉදිරිපත් කළ හැකි ය. 'එමෙන් ම රෝගය සුව වී ද නැත. සුව නොවී ද නැත' යන ප්‍රකාශය ද මෙහි ලා සත්‍ය සේ හැඟෙ යි.

වෛද්‍ය දැනුමෙන් පරිපූර්ණ වූ වෛද්‍යවරයා මෙ ම රෝග තත්ත්ව තේරුම් ගන්නා මුත්, ඒ පිළිබඳ නිසි අවබෝධය නොලත් සාමාන්‍ය පුද්ගලයකුට එය තේරුම් ගැනීම අපහසු ය. නමුත් එවැනි රෝග සත්‍ය වශයෙන් ම පවතින බව ආයුර්වේද රෝග වර්ගීකරණයෙන් ද මනාව වටහා ගැනීමට හැකි වේ. එමෙන් ම මෙවැනි රෝග පිළිබඳ ව බටහිර වෛද්‍ය විද්‍යාවේ ද විවිධ නිගමනවලට එළඹ සිටි ලෝකයේ යථා ස්වරූපය හා මිනිස් සිරුරේ පවතින සාමාන්‍යතාව පිළිබඳ ව සාක්ෂියක් මෙහි ගැබ්ව පැවතීම සුවිශේෂිතාවකි. ආයුර්වේද වෛද්‍ය විද්‍යාව ලෝකය හා පුරුෂයා පිළිබඳ ව මෙසේ විස්තර කර යි. යම් සේ දඬු තුනක් එකිනෙක සංයුක්ත කළ විට නො පෙරළී සිටීමට සමර්ථ වේ ද, ඒ සංයුක්ත දඬු තුන මත මැටි බඳුන් ආදියත් තැබුවත් දරා සිටී ද, එසේ ම මනස්, ආත්මන් ශරීර යන ත්‍රිවිධ පදාර්ථයන් ගේ සංයෝගයට පුරුෂ, ලෝක යයි කියනු ලැබේ. පුරුෂයා ම චේතනා පදාර්ථ යයි. සැප දුක් දෙක ම ආධාරය පුරුෂයාම යි. ආයුර්වේද ය ද ඒ පුරුෂයා සඳහා ම ප්‍රකාශිත යි. මේ කරුණු අනුව ලෝකයේ පවතින යම් ස්වරූපයන් වේ ද ඒ සියල්ල ම සිරුර තුළ ද එසේ ම පවතින බව නිගමනය කළ හැකි ය. එසේ ම ආයුර්වේදයේ ආයුෂ පිළිබඳ ව දැක්වෙන ප්‍රකාශ ද මෙලෙස විශ්ලේෂණය කොට චතුෂ්කෝටික ප්‍රකාශන ලෙස විදහා දැක්විය හැකි බව පෙනේ.

> හිතා හිතං සුඛං දුඃ ඛං මායුස් තස්‍ය හිතාහිතම්
> මානංච තච්ච යත්‍රෝක්ත - මායුර්වේදඃ ස උච්‍යතේ [14]

මෙහි දැක්වෙන ආකාරයට මිනිසා ගේ ආයුෂ ප්‍රධාන වශයෙන් කොටස් 2කට බෙදා වර්ග කළ හැකි ය.

| | | |
|---|---|---|
| පළමු බෙදීම | (1) | හිත ආයුෂ |
| | (2) | අහිත ආයුෂ |
| දෙවැනි බෙදීම | (1) | දුඃඛ ආයුෂ |
| | (2) | සුඛ ආයුෂ |

මෙහි දෙවැනි බෙදීම අනුව ආයුෂ විශ්ලේෂණය කොට ආයුෂ පිළිබඳ ව ප්‍රකාශන 4ක් ගොඩ නැඟීමට හැකි බව පෙනේ. මෙ ම ප්‍රකාශන වෛද්‍යවරයාට රෝගීන් පිළිබඳ යථා අවබෝධය තුළින් ගොඩනඟා ගැනීමට හැකි ය.

සුඛ ආයු විඳි
දුඛ ආයු විඳි
සුඛ ආයු ද දුඛ ආයු ද විඳි
සුඛ ආයු ද නොවිඳි දුඛ ආයු ද නොවිඳි

සුඛ ආයු විඳින්නා තමා නිරෝගිමත් ව ජීවත්වීමට අවශ්‍ය දෑ නොඅඩු ව ලබමින් ජීවිතය පවත්වා ගනී. සමාජයට ද හිතකර දේ කර යි. දුඛ ආයු ලබන්නා ඉසුරින් මෙන් ම සෞඛ්‍යයෙන් පිරිහී පීඩාවට පත් වේ. සුඛ මෙන් ම දුඛ ආයු විඳින්නා තමා ම දුක් අනුභව කරමින් සමාජ මෙහෙවරය නිසි පරිදි සිදු කර යි. සමාජයෙන් ගරු බුහුමන් ද ලබයි. සුඛ මෙන් ම දුඛ ආයු නොවිඳින්නා ලෝකෝත්තර සුවයට ආසන්න පුද්ගලයන් සේ සැලකීම සුදුසු සේ හැඟේ. මෙවැනි පුද්ගලයන් විඳීමක් නො ලබන අතර උපේක්ෂාශිලී වීම මෙයට එක් හේතුවක් සේ සැලකිය හැකි යි. මෙවැනි පුද්ගලයන් ප්‍රායෝගික වශයෙන් වෛද්‍යවරුන්ට හමුවීම සුලබ ය.

චතුෂ්කෝටික ප්‍රකාශන සංකේතාත්මක ව පහත අයුරින් පෙන්වා දිය හැකි ය.

| | |
|---|---|
| $P$ | – |
| $\sim P$ | – |
| $(P \wedge \sim P)$ | – |
| $\sim (P \wedge \sim P)$ | – |

බුදුරජාණන් වහන්සේ ධරමාන යුගය වන විට පැවැති දෙසැටක් දර්ශනවාද ද, දුකට මුල් හේතු ද පිළිබඳ ව ඉතා පැහැදිලි අවබෝධයකින් යුක්ත ව පටිච්ච සමුප්පාද සහිත මධ්‍යම ප්‍රතිපදාව දේශනා කළ අතර, සයංකත වාද, පරංකතවාද, සයංකත පරංකත වාද, අධිච්ච සමුප්පන්න යන සියල්ල නිෂ්ප්‍රභා කළ බව සංයුක්ත නිකායේ අචෙල කස්සම සූත්‍රයේ හා දීඝනිකායේ මහා නිදාන සූත්‍රයේ දැක් වේ.

ආයුර්වේද පිළිබඳ මහාචාර්ය සරත් රණසිංහයන් පෙන්වා දෙන්නේ ආයුර්වේදයේ දක්නට ලැබෙන්නේ ත්‍රිකෝටික තර්ක ක්‍රමයක් බවයි.

---


ආශ්‍රිත ග්‍රන්ථ:

1. *දීඝ නිකාය* 1 – සාමඤ්ඤඵල සූත්‍රය – 115-116 පිටු.
2. Alex Wayman, "Who vinterstand the four Alternatives of Buddhist Texts" – *Philosophy East and West*, 27, 1979 No. 1.
3. Louis de la vallee Poussin, "The Way of Nirvana" – Cambridge University Press, 1917, p. 111.
4. C. A. F. Rhys Davids, Logic (Buddhist), *Encyclopaedia of Religions and Ethics*, ed. James Hasrings, Vol. 8, p. 133, B. M. Barug, A History of Pre Buddhistic Indian Philosophy (Calcutta, University of Culcutta, 1921), p. 47.
5. කේ. එන්. ජයතිලක, *මුල් බුදුසමයේ ඥාන විභාගය*, 520. පිටුව (හේ. මු. තිලකරත්න. පරි.), ගොඩගේ ප්‍රකාශකයෝ, මරදාන, 2003.
6. කේ. එන්. ජයතිලක, මුල් බුදුසමයේ ඥාන විභාගය, 532. පිටුව (හේ. මු. තිලකරත්න. පරි.), ගොඩගේ ප්‍රකාශකයෝ, මරදාන, 2003.
7. දීඝ නිකාය 1 බු. ජ. ත්‍රි. ග්‍රන්ථ මාලා, පිටුව 31.
8. මජ්ඣිම නිකාය 1 බු. ජ. ත්‍රි. පිටුව 341.
9. අසංග තිලකරත්න, *ශූන්‍යතා වාදයේ දර්ශනය හා චරනය*, ගොඩගේ ප්‍රකාශන, 2001, පිටුව 46.
10. ඇල්පිටියේ ඤාණිස්සර හිමි, *සාම්ප්‍රදායික හා නවීන තර්ක ශාස්ත්‍රය*, අරගා ප්‍රින්ටර්ස්, පේරාදෙණිය පාර, මහනුවර, පිටුව 69.
11. *පදාර්ථව්‍යාඛ්‍යා සහිත චරක සංහිතාව*, ප්‍රථම භාගය, ආරියදාස කුමාරසිංහ, ආයුර්වේද දෙපාර්තමේන්තුව, 1991, 178 පිටුව.
12. *A Sanskrit English Dictionary*, Motilal Banarsidass Publishers Private Limited, Delhi, 1999, p. 1202.
13. *චරක සංහිතාව* (සිංහල අනුවාදය) ආර්. බුද්ධදාස, ආයුර්වේද දෙපාර්තමේන්තුව, 1960, පිටුව 5.
14. *චරක සංහිතාව* (ප්‍රථම භාගය), ආරියදාස කුමාරසිංහ, දීපානි මුද්‍රණාලය, ගංගොඩවිල, නුගේගොඩ, 1991, පිටුව 12.